# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2014 අගෝස්තු මස 19 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් 2014.08.05 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/ vi (1) / 14 / 31 )

(අ) මූලික රෝහලක හදිසි ප්‍රතිකාර ඒකකය සෝදන බව පවසා, රෝගියකු වාට්ටුවට ඇතුලත් කර නොගැනීමට හැකිද ?

(ආ) 2014-07-12 දින හොරණ මූලික රෝහලට ඇතුළත්වීමට පැමිණි හොරණ, පොකුණුවිට කරදගහවත්ත ප්‍රදේශයේ පදිංචි කොලඹගේ දොන් ලක්ෂ්මී නැමති 54 හැවිරිදි රෝගියාට රෝහලේ අදාළ වෛද්‍යවරයා විසින් හදිසි ප්‍රතිකාර ඒකකය සෝදන බව පවසා රෝගියාගේ දියණිය වන හර්ෂණී ජයවර්ධන යන අයට තුණ්ඩු කැබැල්ලක් දී රෝහල ඉදිරිපිට ඇති පෞද්ගලික රෝහලින් ප්‍රතිකාර ගැනීමට යවා ඇති බව ඔබතුමා දන්නේද ?

(ඇ) එම පෞද්ගලික රෝහලෙන් ප්‍රතිකාර ලබා නිවසට ගිය රෝගියා එදින රාත්‍රියේම මියගොස් ඇති බව දන්නේද?

(ඈ) හොරණ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වන්නේද?

(ඉ) නො එසේ නම් ඒ මන්ද ?

(ඊ) පරීක්ෂණයක් පවත්වන්නේ නම් එහි වත්මන් තත්වය කුමක්ද?

02. ගරු කේ.ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන. නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන පළාත් පාලන හා පළාත් පරිපාලන. මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/ vi (1) / 14 / 33 )

(අ) අළුබෝමුල්ල එස්. මහින්ද මහා විද්‍යාලයේ වර්තමාන සිසුන් සංඛ්‍යාව උසස් පෙළ පන්තිද ඇතුළුව එක් එක් ශ්‍රේණි වශයෙන් කොපමණද?

(ආ) එම සිසුන් සංඛ්‍යාව 1990-2000 වර්ෂ කාල පරාසයේ සිටි සිසුන් සංඛ්‍යාවට සාපේක්ෂව, ක්‍රමිකව මේ දක්වා සිදුවූ බරපතල කඩා වැටීමක් බව පිළිගන්නේද?

(ඇ) විද්‍යාලයේ වර්තමාන පරිහානියට ප්‍රමුඛ හේතුව ඔබතුමා හඳුනා ගෙන තිබේද? එසේ නම් ඒ කුමන තත්වයන්ද?

(ඇ) එම කඩා වැටීමට ප්‍රධානතම හේතුව වර්තමාන විදුහල්පතිවරයාගේ දුර්වල පරිපාලනය සහ අයථා ලෙස මුල්‍ය පරිහරණය බව පිළිගන්නේද?

(ඉ) මෙම තත්වය මැඩපවත්වමින් විද්‍යාලයේ අනාගත දියුණුවට යම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද?

(ඊ) විද්‍යාලයේ ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් සහ භූමිය නිසි නඩත්තුවක් නොමැතිකම නිසා හානියට පත්ව ඇති බව පිළිගන්නේද?

(උ) විද්‍යාලයේ පැවති විද්‍යාගාරය ප්‍රයෝජනයට ගැනීමට තරම් ප්‍රමාණවත් සිසුන් නොසිටියදී මහින්දෝදය විද්‍යාගාරය ඉදිකිරීමට විද්‍යාලයේ ක්‍රීඩා පිටියේම කොටසක් වෙන් කර ලබාදීම නිස්සාර කටයුත්තකට පාසැලේ ක්‍රීඩා පිටිය යොද ගැනීමකට අවසර ලබාදීමක් ලෙස ඔබතුමා පිළිගන්නේද?

03. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර / vi (1) / 14 / 34)

අ) කැළණිය අධ්‍යාපන කලාපයේ හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා සම්බන්ධව මුල්‍ය අක්‍රමිකතා පිළිබඳ මූලික විමර්ශනයක් සිදුකර තිබේද?

ආ) එම මූලික විමර්ශණයේ නිර්දේශයන් මොනවාද?

ඇ) එකී නිර්දේශයන්ට අනුව විදුහල්පතිවරයාට එරෙහිව ගත් ක්‍රියාමාර්ග තිබේද?

ඇ) එසේනම් ඒ මොනවාද?

ඉ) මෙකී විදුහල්පතිවරයා තවමත් මෙම විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කරන්නේ කුමන පදනමකින්ද?

ඊ) මෙකී විදුහල්පතිවරයා, විදුහල්පති සේවයේ දරන ශ්‍රේණිය කුමක්ද?

උ) මෙම විද්‍යාලයේ විදුහල්පති සේවයේ පත්වීම් සහිත විදුහල්පතිවරුන් කී දෙනෙකු සිටී ද?

ඌ) ඔවුන් කවුරුන්ද?හා ඔවුන්ගේ විදුහල්පති ශ්‍රේණින් මොනවාදැයි මෙම සභාවට දැනුවත් කරන්නේ ද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව :

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සුනිල් වටගල මන්ත්‍රීතුමා

"බස්නාහිර පළාත තුළ මධ්‍යම ආණ්ඩුව මගින් විවිධ සංවර්ධන යෝජනා ක්‍රමවල නාම කරන යොදා ගනිමින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලින් සීඝ්‍ර ලෙස සිදු කරමින් පවති. මෙම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ ඇතැම් ස්ථාන සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනතේ හෝ ඒ ආශ්‍රිත රෙගුලාසින් අනුගමනය නොකිරීම නිසා පළාතේ ජනතාව මහත් අසීරුතාවයට මුහුණ පා ඇත. නෛතිකව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුල හිමි විය යුතු වන්දි මුදල් හෝ විකල්ප සහනද බොහෝ අවස්ථා වලදී හිමි නොවේ. නෛතිකව ඉඩම් අත්පත් කරගත හැක්කේ මහජන කාර්යයන් සඳහා පමණක් වන අතර. ඉන් පරිබාහිර කරුණු සඳහා ඉඩම් අත්පත් කරගත නොහැක. එබැවින් පවතින නිතිරිති වලට අනුගතව පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුකරන ලෙසට ඊට අදාළ වගකිවයුතු නිලධාරීන් මෙන්ම මැති ඇමතිවරුන්ද වහා දැනුවත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/VI (1) /14/03)

02. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා:

"මධ්‍යම රජය ජනතාව මත බදු බර පටවා ජනතාව අසීරුතාවයට පත්කර ඇති හෙයින්, පළාතේ ආදායමෙන් පළාතේ පුරවැසියන්ට, ජීවන වියදම අඩු කර අවශ්‍ය සහන ලබා දීමට කටයුතු කිරීම මැනවි"යි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/ vi (1) / 14 / 04 )

## XI. පොදු කටයුතු

01. ගරු කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළුවාරිමාර්ග, කර්මාන්ත පරිසර කටයුතු හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා (බ.ප.):

'2013 අංක --- දරන බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය'

(දෙවනවර කියැවීම)

[ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම 2014.06.17 දින සිදුකර ඇත.]

02. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, නි හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවාත්ති අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරි කරනු ලැබීමට:

යෝජනාව:

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

## (දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ, දොඩන්ග ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ - " ත්‍රීරෝද නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා ප පරිපාලන, මිනිස් බල හා රැකිරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත ක

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1824 දරණ හා 2013.08.16 වැනි දිනැති ගැසට් පත්‍රයේ පල කරන්නට අතර,

එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවි පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභ ඉදිරිපත් කරමි.

03 ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවාත්ති අමාත්‍යතුමා (බ.ප.) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව:

### පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව (මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව)

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ 'මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව' විසින් සාදන ලද මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, හා පීඩාකාරී - අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යාවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාව,

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන)පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, මිනිස් බල හා රැකිරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846\13 දරණ හා 2014.01.20 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,

එකී අතුරු ව්‍යවස්ථාවන්ට, අවසර නොදිම නොකරන ලෙසට යෝජනා කරමින්ම, එම අතුරු ව්‍යවස්ථාවන්. 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.'

### XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.08.06 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.